# ව්‍යවස්ථාව

01. පක්ෂයේ නම : " සිංහල රාවය"

02. පක්ෂයේ ලකුණ : " දියමන්තිය"

03. පක්ෂයේ පාට : " තද කහ"

04. පක්ෂයේ ප්‍රතිඥාව :

දෙස් විදෙස් අභියෝග හමුවේ සිංහල ජාතියත්, බෞද්ධයාත්, සමස්ථ ශ්‍රී ලාංකික ජනතාවත් අනතුරකට ලක්ව ඇති මොහොතක කොන්දේසි විරහිතව පක්ෂයේ ප්‍රතිපත්ති හා අරමුණු පටු ආත්මාර්ථයන් උදෙසා පාවා නොදෙමින් රට, ජාතිය, සමය උදෙසා මාගේ මෙහෙවර හැකි උපරිමයෙන් ඉටු කිරීමට, හෘද සාක්ෂිය අභිමුවේ දී ප්‍රතිඥා දෙමි.

05. පක්ෂයේ අරමුණු :

i. සිංහල ජාතියේ හා බෞද්ධ ශාසනයේ ආරක්ෂකයා ලෙස ක්‍රියා කිරීම.
ii. සිංහල ජාතියේ වර්ධනය වෙනුවෙන් වැඩපිළිවල් සකස් කිරීම.
iii. සිංහල ජාතික අනන්‍යතාවය හා උරුමයන් වෙනුවෙන පෙනි සිටීම.
iv. ශ්‍රී ලාංකික ජනතාවගේ අයිතිය වෙනුනේ පෙනී සිටීම.
v. ශ්‍රී ලංකාව තුල සුරක්ෂිත හා සාමකාමී රටක් නිර්මානය කිරීම.
vi. දේශීය කෘෂි කර්මාන්තය නගා සිටුවමින් ස්ථාවර රටක් බිහිකිරීම.
vii. එකම රටක් එක නීතියක් තුල රට පාලනය කිරීම.
viii. ධාර්මිෂ්ඨ රටක් නිර්මානය කිරීම.

..............................
ලක්ප්‍රිය පෙරේරා
ලේකම්
සිංහල රාවය
2021/05/10

06. පක්ෂයේ ව්‍යුහය :

i. උත්තරීතර මණ්ඩලය
ii. දේශපාලන මණ්ඩලය
iii. දිස්ත්‍රික් සංවිධාන
iv. ආසන බල මණ්ඩල
v. කොට්ඨාස බල මණ්ඩල
vi. කාන්තා සංවිධානය
vii. වෘතීය සමිති එකමුතුව
viii. වෘතිකයන්ගේ එකමුතුව
ix. පරිසර කමිටුව
x. තරුණ සංවිධානය

07. උත්තරීතර මණ්ඩලයේ සංයුතිය

i. සාමාජික සංඛ්‍යාව 17කි. (කාන්තා සාමාජිකාවන් අවම 01 ක් සමගින්)
ii. නිල කාලය වසර 04කි.
iii. එක් පුද්ගලයෙකුට හිමි වනුයේ එක් චන්දයකි.
iv. මුලසුන පක්ෂ නායකයා ගනු ලබයි.
v. පක්ෂ නායකයා නොමැති විට උප සභාපති තුමා මුලසුන හොබවයි.
vi. සෑම විටම රැස්වීමට නම් සනපූර්ණය තිබිය යුතුය. (සනපූර්ණය අවම සාමාජිකයන් 10ක් සිටිය යුතුය.)

08. උත්තරීතර මණ්ඩලයේ නිලදාරී මණ්ඩලය

i. සභාපති / පක්ෂ නායක. ( පක්ෂ සභාපති පක්ෂ නායකයාද වේ.)
ii. මහා ලේකම්
iii. උප සභාපති
iv. භාණ්ඩාගාරික
v. ජාතික සංවිධායක ( පැවිදි)
vi. ජාතික සංවිධායක ( ගිහි)
vii. ප්‍රචාරක ලේකම්

12 b

viii. මාධ්‍ය ලේකම්
ix. විදේශ කටයුතු ලේකම්
x. කාන්තා කටයුතු ලේකම්
xi. පරිපාලන ලේකම්
xii. කාරක සභිකයන් 06 දෙනකි.

09. දේශපාලන මණ්ඩලය

i. සාමාජික සංඛ්‍යාව 25 කි.
ii. පක්ෂයේ නායක, මහලේකම්, ජාතික සංවිධායක,භාණ්ඩාගාරික, කාන්තා ලේකම් වරිය ඇතුළුව උත්තරීතර මණ්ඩලය බහුතර එකඟතාවයෙන් පත්කල සාමාජිකයින් 20 දෙනා සමග.
iii. නිල කාලය වසර 02කි.
iv. උත්තරීතර මණ්ඩලය බහුතර එකඟතාවයෙන් පත්කල සාමාජිකයින් 20 දෙනා සමග.
v. පක්ෂය නියෝජනය කොට පාර්ලිමේන්තුව නියෝජනය කරන මන්ත්‍රීවරුන් මෙහි අනිවාර්යයෙන් සාමාජිකයන් වන්නේය. සාමාජික සංඛ්‍යාව මෙහිදි වැඩිවිය හැක.
vi. උත්තරීතර මණ්ඩලය බහුතර එකඟතාවයෙන් ඕනෑම සාමාජිකයකු ඉවත් කල හැක.

10. උත්තරීතර මණ්ඩලයේ කාර්යයන්

i. සාමාජික සංඛ්‍යාව 17 කි.
ii. පක්ෂයේ සියළුම දේශපාලන, පරිපාලන හා සියළුම තින්දු තීරණ ගන්නා මණ්ඩලයයි.
iii. පක්ෂ නායකයාට අමතරව සියළු සාමාජිකයින් හා නිලදාරීන් පත්කිරීමේ හා ඉවත් කිරීමේ බලය හිමි මණ්ඩලයයි.
iv. පක්ෂයේ සාමාජිකයෙකු හා දේශපාලන මණ්ඩල සාමාජිකයෙකු මෙහි බහුතර කැමැත්තෙන් ඉවත් කිරීමට හා පක්ෂ නායකයාගේ අනුමැතියෙන් පත්කිරීමට හැක.
v. උත්තරීතර මණ්ඩලයේ සාමාජිකයෙකු ඉවත් කල හැක්කේ 2/3 කැමැත්තෙනි.

vi. පක්ෂයේ මහ ලේකම්වරයා ඉවත් කිරීමට උත්තරීතර මණ්ඩලයේ 14/17 දෙනෙකුගේ කැමැත්තක් අවශ්‍ය වේ. ඉවත් කිරීමක් සිදුවුවහොත් විධායක සභාවේ 2/3 ක කැමැත්තෙන් හා පක්ෂ නායකගේ එකඟතාවයෙන් අලුතින් ලේකම්වරයෙකු පත්කර ගල හැක.

vii. පක්ෂයේ නායකයා/ සභාපතිවරයා ඉවත් කිරීමට උත්තරීතර මණ්ඩලයේ 15/17 දෙනෙකුගේ කැමැත්තක් අවශ්‍ය වේ.

viii. පක්ෂයේ ව්‍යවස්ථාව වෙනස් කිරීම හෝ සංශෝධන කිරීමට නම් උත්තරීතර මණ්ඩලයේ 2/3 කැමැත්තක් අවශ්‍ය වේ.

ix. උත්තරීතර මණ්ඩලයට අලුතින් පත් කිරීමේ බලය පක්ෂ නායකයාට හිමිවෙයි.

x. උත්තරීතර මණ්ඩලය කැඳවීම පක්ෂ නායකයාගේ උපදෙස් පරිදි පක්ෂ මහ ලේකම් විසින් සිදුකල යුතුය.

xi. පක්ෂ නායකයා ඉවත් වූවිට, මිය ගිය විට හෝ ඉවත් කිරීමක් සිදුවුවහොත් විධායක සභාවේ 2/3 ක කැමැත්තෙන් අලුතින් නායකයෙකු පත්කර ගත හැකිය.

xii. විධායක සභාවේ 2/3 ක තීරනය වනුයේ නොපැමිණි සාමාජිකයන් ඇතුලත්ව එනම් සම්පූර්ණ 17 දෙනාගෙනි. එනම් 11 දෙනෙකුගේ කැමැත්ත අනිවාර්යය වේ.

11. දිස්ත්‍රික් සංවිධාන

i. සාමාජික සංඛ්‍යාව 25 කි.

ii. පක්ෂ නායකයා, ලේකම්, ජාතික සංවිධායක හා භාණ්ඩාගාරික හැර

iii. පක්ෂ නායකයා, ලේකම්, ජාතික සංවිධායක හා භාණ්ඩාගාරික අනිවාර්යයෙන් සාමාජිකයින් වේ.

iv. දිසිත්‍රික් සංවිධායකයින් අනිවාර්යයෙන් සාමාජිකයන් වේ.

v. දිසිත්‍රික් සංවිධායකයින් පත්කරනුයේ පක්ෂයේ නායකයා විසිනි.

vi. දිසිත්‍රික් සංවිධායකයින් ඉවත් කිරීමේ බලය පක්ෂයේ නායකයා සතුය.

12. ආසන බලමණ්ඩල

i. බලමණ්ඩලයක නිලදාරී සංඛ්‍යාව 12 කි.
ii. සෑම මැතිවරණ බල ප්‍රදේශයකට එක බැගින් තිබිය හැක.
iii. සාමාජික සංඛ්‍යාව උපරිමයකි.
iv. ආසන සංවිධායක නිල බලයෙන් සභාපති වේ.
v. ආසන සංවිධායක පත්කරනුයේ නායකයාගේ අනුමැතියෙන් දිස්ත්‍රික් සංවිධායක විසිනි.
vi. පක්ෂ නායකයාට ඕනෑම මොහොතක ආසන සංවිධායකයින් ඉවත් කල හැක.

13. කොට්ඨාස බලමණ්ඩල

i. බලමණ්ඩලයක නිලදාරී සංඛ්‍යාව 10 කි.
ii. සෑම කොට්ඨාස බල ප්‍රදේශයකට එක බැගින් තිබිය හැක.
iii. සාමාජික සංඛ්‍යාව උපරිමයකි.
iv. කොට්ඨාස සංවිධායක නිල බලයෙන් සභාපති වේ.
v. කොට්ඨාස සංවිධායක පත්කරනුයේ දිස්ත්‍රික් නායකයාගේ අනුමැතියෙන් ආසන සංවිධායක විසිනි.
vi. පක්ෂ නායකයාට ඕනෑම මොහොතක ආසන සංවිධායකයින් ඉවත් කල හැක.

14. කාන්තා බලමණ්ඩලය

i. බලමණ්ඩලයේ නිලදාරී සංඛ්‍යාව 12 කි.
ii. කාන්තා කටයුතු ලේකම් මෙහි සභාපතිනිය වේ.
iii. සාමාජික සංඛාව උපරිමවේ.
iv. නිලදාරීන් පත්කිරීමේ බලය සභාපතිනිය සතුවේ.
v. මෙහි ඕනෑම කෙනෙක් ඉවත් කිරීමේ බලය පක්ෂ නායකයාට හිමිවේ.

15. පක්ෂ නායකයාගේ බලතල

i. පක්ෂයේ සභාපති, පක්ෂ නායකයා වන්නේය.
ii. පක්ෂයේ සියළුම රැස්වීම් වල මුලසුන හෙබවිය යුතුය.
iii. සියළු පරිපාලන තීරණවල අවසාන බලය හිමිවේ.
iv. උත්තරීතර මණ්ඩල, දේශපාලන මණ්ඩල, ආසන හා කොට්ඨාස වල නිලදාරීන් හා සාමාජිකයින් ඉවත් කිරීමේ බලය හිමිවේ.
v. වෙනත් දේශපාලන පක්ෂ සමග සාකච්චා හා අවබෝධතාවයන් පිළිබඳ තීරණය ගැනීමේ බලය හිමිවේ. උත්තරීතර මණ්ඩලයේ 2/3 ලබාගෙන ක්‍රියාත්මක එය කලයුතුය.

16. පක්ෂ මහලේකම්ගේ බලතල

i. පක්ෂයේ සියළු ලිපි ලේඛණ ලග තබාගැනීම හා සුරක්ෂිතභාවය මහු සතු කාර්යයකි.
ii. පක්ෂයේ සියළු නාම ලේඛණ ලග තබාගැනීම හා සුරක්ෂිතභාවය මහු සතු කාර්යයකි.
iii. පක්ෂයේ දේශපාන, පරිපාලන කටයුතු වෙනුවෙන් වෙනුවෙන් ලිපි සකස් කිරීම හා අත්සන් කිරීම මහු සතු කාර්යයකි.
iv. පක්ෂය වෙනුවෙන් මැතිවරණ කොමිසම නියෝජනය කිරීමේ වගකීමද මහු සතු කාර්යයකි.
v. පක්ෂය වෙනුවෙන් සියළු පත්වීම්, ගිවිසුම් හා ඕනෑම ලිපියක අත්සන යෙදීම මහු සතු කාර්යයකි.

17. පක්ෂ භාණ්ඩාගාරිකගේ බලතල

i. පක්ෂය වෙනුවෙන් මුදල් රැස්කිරීමේ බලය හිමිවේ.
ii. පක්ෂයේ සියළු සංවිධාන හා සාමාජිකයන් රැස්කරන මුදල් එකතු කොට තැන්පත් කිරීම භාණ්ඩාගාරික සතු වගකීමයි.
iii. සාමාජික මුදල් හා අරමුදල් කළමනා කිරීම භාණ්ඩාගාරික සතු වගකීමයි.
iv. පක්ෂයේ වර්තමාන මූල්‍ය තත්වය සෑම උත්තරීතර මණ්ඩල රැස්වීමකට ඉදිරිපත් කල යුතුය.

v. වාර්ෂික අය වැය වාර්ථාව පක්ෂයේ උත්තරීතර මණ්ඩලයේ අනුමැතියට යටත්ව මහා සභා රැස්වීමට ඉදිරිපත් කල යුතුය.

vi. පක්ෂය වෙනුවෙන් මුදල් රැස්කිරීමේ දී ලැබෙන සියළු මුදල් බැංකු ගත කල යුතුය.

18. පක්ෂයේ මූල්‍ය කටයුතු

i. උත්තරීතර මණ්ඩලයේ බහුතර අනුමැතියෙන් අනුමත කල බැංකුවල පක්ෂයේ නමින් ගිණුම් පවත්වා ගත යුතු වේ.

ii. පක්ෂයේ තැන්පත් මුදල් නැවත ලබාගැනීමේදී භාණ්ඩාගාරික සමග පක්ෂයේ සභාපති හෝ ලේකම්ගේ අත්සන අනිවාර්යය වේ.

iii. පක්ෂයේ තැන්පත් මුදල් රු. ලක්ෂයකට වඩා නැවත ලබාගැනීමේදී භාණ්ඩාගාරික සමග පක්ෂයේ සභාපති හා ලේකම්ගේ අත්සන අනිවාර්යය වේ.

iv. සියළු වියදම් වෙනුවෙන් ලදු පතක් ලබා ලග තබාගත යුතු අතර සියළු ලැබීම් වලදී රිසිට් පතක් ලබා දිය යුතුය.

v. සියළු රු.10.000ට වැඩි වියදම් වෙනුවෙන් හා ලැබීම් වලදී රිසිට් පත් වලට පක්ෂ නායකයාගේ අත්සන ලබා ගත යුතු වේ යුතුය.

vi. ඊට අඩු වියදම් හා ලැබීම් සඳහා භාණ්ඩාගාරික තුමාගේ අත්සන ප්‍රමාණවත්ය.

19. පක්ෂ උප සභාපතිගේ බලතල

i. පක්ෂයේ නායකතුමා නැති අවස්ථා වලදී සෑම රැස්වීමක්ම මෙහෙය වීමේ වගකීම ඔහු සතුය.

ii. පක්ෂයේ අවශ්‍යතාවය මත උත්තරීතර මණ්ඩලයේ බහුතර කැමැත්තෙන් උප සභාපතිවරු දේශපාලන මණ්ඩලයට පත්කල හැක. එහෙත් ඔවුනට උත්තරීතර මණ්ඩලයේ ඡන්ද බලය හිමි නොවේ.

පෙරේරා

20. ජාතික සංවිධායකගේ බලතල කාර්යය

i. පක්ෂයේ දිසිත්‍රික්, ආසන හා කොටඨාස බල මණ්ඩල වල සංවිධායකයින් පත් කිරීමේ බලය මහා ලේකම් තුමාගේ අනුමැතිය ඇතිව සතුය.
ii. පක්ෂයේ සංවිධාන කටයුතු හා ප්‍රවර්ධනයට කටයුතු කිරීම ඔහුගේ වගකීම වේ.
iii. මහා ලේකම් තුමාගේ අනුමැතිය ඇතිව සියළු සංවිධායකයින් රැස්කිරීමේ බලය ඔහු සතුය.

21. ප්‍රචාරක ලේකම්ගේ බලතල

i. පක්ෂයේ ප්‍රචාරක යාන්ත්‍රණය ක්‍රියාත්මක කිරීමේදී මූලිකත්වය ගෙන කටයුතු කිරීම.
ii. පෝස්ටර්, බැනර් හා කටවුට් ආදි ප්‍රචාරක වැඩකටයුතු වලදී පක්ෂයේ ලේකම් හෝ සභාපතිගේ අනුමැතිය ගෙන ක්‍රියාත්මක කිරීම.
iii. සමාජ මාධ්‍ය කටයුතු වලදී පක්ෂයේ ප්‍රචාරක යාන්ත්‍රණය ක්‍රියාත්මක කිරීම.

22. මාධ්‍ය ලේකම්ගේ බලතල හා කාර්යයන්

i. පක්ෂයේ මාධ්‍ය හමු ක්‍රියාත්මක කිරීමේදී මූලිකත්වය ගෙන කටයුතු කිරීම. මාධය වල පක්ෂයේ ප්‍රචාරක යාන්ත්‍රණය මෙහෙය වීම.
ii. විද්‍යුත් හා අනිකුත් ජනමාධ්‍ය ආදි ප්‍රචාරක වැඩකටයුතු වලදී පක්ෂයේ ලේකම් හෝ සභාපතිගේ අනුමැතිය ගෙන ක්‍රියාත්මක කිරීම.
iii. පක්ෂයේ නිල පුවත්පතේ ක්‍රියාකාරී කටයුතු සම්පූර්ණයෙන් සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.

23. විදේශ කටයුතු ලේකම්ගේ බලතල හා කාර්යයන්

i. පක්ෂයේ විදේශ ශාඛා සමග සම්බන්ධතා පැවැත්වීම
ii. පක්ෂය විදේශ රටවල අය සමග සම්බන්ධ කරවීම, සම්බන්ධතා ආරම්භ කිරීම හා ප්‍රචාරක වැඩකටයුතු තුලින් විදේශ රටවල් වල පක්ෂයේ ශාඛා සමිති අලුතින් ඇති කිරීමට වැඩ පිලිවෙලවල් සකස් කිරීම හා විදේශ ආධාර හා අරමුදල් පක්ෂය වෙත ලබාගැනීමට කටයුතු කිරීම.

24. පරිපාලන ලේකම්ගේ බලතල

i. පක්ෂයේ සේවය කරන සේවකයින් පරිපාලන කටයුතු කිරීම.
ii. පක්ෂයේ කාර්යාලයේ සේවකයින් හා වත්කම් පිළිබඳව වගකීම හා නඩත්තු කටයුතු පිළිබඳව වගකීම පරිපාලන ලේකම් සතුය.

25. කාන්තා කටයුතු ලේකම්ගේ බලතල

i. පක්ෂයේ සියළු කාන්තා පිළිබඳව පරිපාලන කටයුතු කිරීම.
ii. සියළු කාන්තා සංවිධාන වල මූලික ගෙන කටයුතු කිරීම.
iii. සියළු කාන්තා සංවිධාන වල නිලදාරීන් පත්කිරීම.

26. රැස්වීම් පැවැත්වීම

i. පක්ෂයේ සියළු දේශපාලන මණ්ඩල, ආසන බලමණ්ඩල හා කාන්තා බලමණ්ඩල සාමාජිකයන් කැඳවා වසරකට වරක් පක්ෂයේ මහා සම්මේලනය පැවැතවිය යුතුය.
ii. එහිදි පක්ෂයේ නව නිලදාරී මණ්ඩලය හෝ දැනට සිටින නිලදාරී මණ්ඩලය ප්‍රකාශයට පත්කල යුතුය.
iii. උත්තරීතර මණ්ඩලය සෑම දෙමසකට වරක්වත් රැස්විය යුතුය.
iv. දේශපාලන මණ්ඩලය සෑම තෙමසකට වරක්වත් රැස්විය යුතුය.
v. ආසන බලමණ්ඩල හා කොට්ඨාස බල මණ්ඩල වසරකට අවම තෙවරක් වත් රැස්විය යුතුයි.

27. පක්ෂයේ නමින් දෙස් විදෙස් උසාවි වල නඩු ගොනුකිරීම,මාධ්‍ය නිවේදන නිකුත් කිරීම. පොලිසී හෝ ඕනෑම තැනක පක්ෂය නමින් පැමිණිලි ගොනුකිරීමේ හැකියාව ඇත. පක්ෂයේ ලේකම් හා සභාපති මෙහිදි පක්ෂය වෙනුවෙන් පෙනීසිටීමේ පූර්ණ බලතල ඇත. එම සියලු නඩු කටයුතු හා පක්ෂය වෙත පැමිනෙන සියලු නඩු කටයුතු වල වියදම් පක්ෂයේ පොදු අරමුදලෙන් වියදම් කල යුතුය.

28. පක්ෂ සාමාජිකත්වය

i. පක්ෂයේ සාමාජිකත්වය ලබා ගැනීමට ලේකම්වරයා වෙත අයදුම් පතක් යොමු කිරීමෙන් ලබාගත හැක.

ii. සියළු සාමජිකයින් පක්ෂය එම වර්ෂයේ තීරණය කරන සාමාජික ගාස්තු ගෙවා සාමාජිකත්වය ලබා ගත යුතුයි.

iii. සියළු සාමජිකයින් වසරට වරක් තම සාමාජිකත්වය අලුත් කර ගත යුතුයි.

iv. යාවජීව සාමාජිකයින් වසර 04ට වරක් තම සාමාජිකත්වය අලුත් කර ගත යුතුයි.

v. යාවජීව සාමාජිකයින් තීරණය කරනුයේ පක්ෂයේ උත්තරීතර මණ්ඩලයේ බහුතර අනුමැතියෙනි.

vi. පක්ෂයේ සාමාජිකයින් වෙනත් පක්ෂයක සාමාජිකත්වය ලබා ගතහොත් අප පක්ෂයේ සාමාජිකත්වය එදිනම අවලංගු වේ. සියළු සාමාජිකයන් පක්ෂයේ විනය හා ප්‍රතිපත්ති මත පිහිටා කටයුතු කල යුතුය. එසේ නොවුනහොත් පක්ෂ නායකයාට ඕනෑම කෙනෙක් ඕනෑම මොහොතක ඉවත් කල හැක. පක්ෂයේ ඕනෑම මන්ත්‍රීවරයෙකු වෙනත් පක්ෂයක සාමාජිකත්වය ලබා ගතහොත් අප පක්ෂයේ සාමාජිකත්වය හා එම මන්ත්‍රීධූරය එදිනම අවලංගු වේ.

vii. පක්ෂයේ ඕනෑම මන්ත්‍රීවරයෙකු වෙනත් පක්ෂයක සමග කටයුතු කිරීම හා පක්ෂයේ ප්‍රතිපත්ති වලට එරෙහිව ක්‍රියා කරන බවට පක්ෂයේ උත්තරීතර මණ්ඩලයේ 2/3 මගින් සනාථ කොට පක්ෂයේ සභාපතිට ලිඛිතව දන්වා සිටිය හොත් ඔහුගේ පක්ෂ සාමාජිකත්වය හා එම මන්ත්‍රීධූරය අහෝසි වනු ඇත. ඒ පිළිබඳව පක්ෂ මහලේකම් දින 07ක් තුල ඔහුට ලිඛිතව දැනුම දිය යුතුය.

.........................................

මහා ලේඛම්ප්‍රිය පෙරේරා
ලේකම්
සිංහල රාවය